රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

17.03.2020

ප්‍රවෘත්ති කර්තෘ / අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති),

<u>ප්‍රවෘත්ති නිවේදනය</u>

**කොවිඩ්-19 වෛරසය රට තුල ව්‍යාප්තවීම හේතු කොට ගෙන දැනට ශ්‍රී ලංකාවට පැමිණ සිටින විදේශිකයන් ලබා ගෙන ඇති සියලුම වර්ගයේ වීසාවන්හි වලංගු කාලය දීර්ඝ කිරීමට අදාළව ආගමන විගමන පාලක ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති මාධ්‍ය නිවේදනය පහත දැක්වේ.**

<u>ශ්‍රී ලාංකික වීසා බලපත් දීර්ඝ කිරීම</u>

කොවිඩ්-19 වෛරසය රට තුල ව්‍යාප්තවීම හේතු කොට ගෙන දැනට ශ්‍රී ලංකාවට පැමිණ සිටින විදේශිකයන් ලබා ගෙන ඇති සියලුම වර්ගයේ වීසාවන්හි වලංගු කාලය දීර්ඝ කිරීමට තීරණය කර ඇත. ඒ අනුව පහත සඳහන් පරිදි කටයුතු කිරීමට කාරුණික වන මෙන් දන්වා සිටිමි.
ඒ අනුව පහත සඳහන් පරිදි කටයුතු කිරිමට කාරුණික වන මෙන් එම දෙපාර්තමේන්තුව වැඩි දුරටත් දන්වා සිටී.

1. දැනට ලබා ගෙන ඇති සියලුම වර්ගයේ වීසාවන්හි වලංගු කාලය 2020 මාර්තු 14 වන දින සිට ඉදිරියට දින 30ක කාලයකට එනම් 2020.04.12 දින තෙක් දීර්ඝ කරනු ලැබේ.
   ඒ අනුව එම සියලුම වීසා දීර්ඝ කිරීම් වලට අදාළ වීසා ගාස්තු ගෙවා වීසාව ඔබගේ විදේශීය ගමන් බලපත්‍රයේ පිටසන් කර ගැනීම සඳහා <u>**2020 අප්‍රේල් මස 08 හා 09 යන දිනවලින් එක් දිනක පමණක්**</u> බත්තරමුල්ල, "සුහුරුපායේ" පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ , 4 වන මහලේ , වීසා අංශයට පැමිණෙන ලෙස දන්වා සිටිමි.
2. මෙම කාලය තුල දී ඔබ දිවයිනෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම් , ඉහත වීසා දීර්ඝ කිරිමට අදාල වීසා ගාස්තු ; ගුවන් තොටුපල වෙත ගෙවා දිවයිනෙන් බැහැර වී යා හැකිය. එහිදී දඩ මුදල් ඔබගෙන් අය කරනු නොලැබේ.
3. ඔබ දැනටමත් වීසා ලබා ගැනීම සඳහා ගමන් බලපත්‍ර ; ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වීසා අංශය වෙත ලබා දී ඇත්නම් , එහිදී ඔබ වෙත ලබා දී ඇති පිලිගැනීමේ රිසිට් පත්‍රයේ (Acknowledgement) වලංගු කාලය ද 2020 මාර්තු 14 වන දින සිට ඉදිරියට දින 30ක කාලයකට එනම් 2020.04.12 දින තෙක් දීර්ඝ කරනු ලැබේ.
   මෙම කාලය තුල දී ඔබ දිවයිනෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම් <u>**පමණක්**</u> , ඔබගේ ගමන් බලපත්‍රය මෙම දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් පහත සඳහන් විද්‍යුත් ලිපිනයන් වෙත ඔබගේ ගුවන් ගමන් ටිකට් පත්‍රයේ පිටපතක් සමග යොමු කල යුතු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ අවස්ථාවන් හිදී ඔබ වෙත ලබා දෙනු ඇත.
   i. piyumeei@gmail.com
   ii. sanjaya7777@gmail.com
   iii. bgayanmilinda@yahoo.com
   iv. hamarathunge@gmail.com
   v. jithanieathukorala@gmail.com

විමසීම් : 0771588724

ඒ අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තු පරිශ්‍රයට පැමිණීමෙන් වලකින ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටින අතර මේ සම්බන්ධයෙන් ඔබ වෙත සිදුවන අපහසුතාවය පිළිබඳ කණගාටුව ප්‍රකාශ කර සිටිමි.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො t (+94 11) 2515759
ෆැ பெ f (+94 11) 2514753
ඊ மி e infodept@slt.lk
www.news.lk

## Extension of Sri Lankan Visa

Due to the spread of the Covid-19 virus in the country, it has been decided to extend the validity period of all types of Visas issued to all foreigners who are currently residing in Sri Lanka.

Hence, you are kindly requested to proceed as advised below.

1. The validity period of all types of Visas will be extended for a period of 30 days **with effect from 14th March 2020 to 12th April 2020.**

   You are hereby informed to visit the Visa Division of the Department of Immigration and Emigration **on either 08th and 09th of April 2020** to pay the relevant fee and to get the visa endorsed in your Passport.

2. If you intend to leave the island during the aforementioned period; your journey will be facilitated by paying the relevant visa fee at the Airport without any penalty.

3. The validity period of the Acknowledgement issued for the applications **already submitted to the Department of Immigration and Emigration** to obtain visas, will also be extended for a period of 30 days **with effect from 14th March 2020 to 12th April 2020.** If you intend to leave the country during this time, a request to obtain your passport from this Department should be sent to the following email addresses along with a copy of your flight ticket. Necessary advises in this regard, will be communicated to you accordingly via the same channel.

   i. piyumeei@gmail.com
   ii. sanjaya7777@gmail.com
   iii. bgayanmilinda@yahoo.com
   iv. hamarathunge@gmail.com
   v. jithanieathukorala@gmail.com

**For Inquiry: 0771588724**

Therefore, you are hereby advised to refrain from visiting the Department of Immigration and Emigration premises during the above period and apologize the inconvenience caused to you in this regard.

නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ජනරාල්